ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2329/45 - 2023 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා - 2023.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47 (VIII)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2) (ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2) (ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් :-

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ''පිලාකටුමුල්ල ශ්‍රී පුෂ්පාරාම පුරාණ විහාරය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය, නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ ''පිලාකටුමුල්ල ශ්‍රී පුෂ්පාරාම පුරාණ විහාර භූමි ප්‍රදේශය'' සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ දී ය.

1A - G 39408 — 16 (2023/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

පිලාකටුමුල්ල ශ්‍රී පුෂ්පාරාම පුරාණ විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 507, පිලාකටුමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිලාකටුමුල්ල ග්‍රාමයේ පිහිටි. සර්වේයර් ජනරාල්ගේ 2022 ඔක්තෝබර් මස 05 දිනැති අංක PU/NTT/Sup. TL/2022/04 දරන පරිපූරක සැලැස්මේ කැබලි අංක 18 පින්කුඹුර, කැබලි අංක 30 පින්නවත්ත, බක්මීගහකුඹුරේ පිල්ලෑව, මාදන්ගහකුඹුරේ පිල්ලෑව සහ දෙඹුනේකැලේ *නොහොත්* කොරොස්වත්ත සහ කැබලි අංක 33 රත්මල්ගහකුඹුර වශයෙන් නිරූපිත හෙක්ටයාර් 3.6887ක් විශාලත්වයෙන් යුතු පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය.

**කැබලි අංක 18 - පිංකුඹුර - හෙක්ටයාර් 1.6343ක්**

*උතුරට* : පිලාකටුමුල්ල (ඇළ ද ඇතුළත්ව) කොටසක් ;
*නැගෙනහිරට* : කැබලි අංක 17 ;
*දකුණට* : කැබලි අංක 19 (ඇළ) ;
*බටහිරට* : කැබලි අංක 20, පිලාකටුමුල්ල (ඇළ ද ඇතුළත්ව) කොටසක්.

**කැබලි අංක 30 - පින්වත්ත, බක්මීගහකුඹුරේ පිල්ලෑව, මාදන්ගහකුඹුරේ පිල්ලෑව සහ දෙඹුනේකැලේ *නොහොත්* කොරොස්වත්ත - හෙක්ටයාර් 1.3737ක්**

*උතුරට* : කැබලි අංක 29 (ඇළ), කැබලි අංක 05 (මාර්ගය) හා කැබලි අංක 31 (ඇළ) ;
*නැගෙනහිරට* : කැබලි අංක 31 (ඇළ) හා කැබලි අංක 45 ;
*දකුණට* : අංක 507/ඒ මහිලාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය ;
*බටහිරට* : අංක 507/ඒ මහිලාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය, කැබලි අංක 27 හා කැබලි අංක 28.

**කැබලි අංක 33 - රත්මල්ගහකුඹුර - හෙක්ටයාර් 0.6807ක්**

*උතුරට* : කැබලි අංක 04 (මාර්ගය), කැබලි අංක 3 හා පිලාකටුමුල්ල (ඇළ ද ඇතුළත්ව) කොටසක් ;
*නැගෙනහිරට* : පිලාකටුමුල්ල (ඇළ ද ඇතුළත්ව) කොටසක් කැබලි අංක 46 හා කැබලි අංක 35
*දකුණට* : කැබලි අංක 35 හා කැබලි අංක 34 (ඇළ) ;
*බටහිරට* : කැබලි අංක 34 (ඇළ) හා කැබලි අංක 4 (මාර්ගය).

EOG 04 - 0198

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.